# පටිච්චසමුප්පාදය (දෙවෙනි කොටස)
## 24.03.2019 - ශ්‍රී ලංකාරාමය
## නවසීලන්තය

හොඳයි, අපි ඊයේ දවසේ මේ පින්වතුන්ට පටිච්චසමුප්පාදයේ කොටසක් කියලා දුන්නා. පටිච්චසමුප්පාදය දැන ගන්නකොට අපි දැන ගන්න ඕන පිළිවෙලක් තිබෙනවා. ඒක එහෙන් මෙහෙන් කියන්න පුළුවන් එකකුත් නොවෙයි. ඒක අතිශය ගාම්භීර ධර්මයක්. පටිච්චසමුප්පාදය කියලාදෙන පටිච්චසමුප්පාදය උගන්වන යම්කිසි පිළිවෙලක් තිබෙනවා. බුදුරාජාණන්වහන්සේගේ කාලයේ ඉඳලාම උන්වහන්සේගේ දේශනාවෙන් ආරම්භවූ ඒ කියලා දෙන පිළිවෙල පරම්පරාවෙන් පරම්පරාවට ආචාර්යන් වහන්සේලා ස්වාමීන්වහන්සේලා පවත්වාගෙන ආවා. ඒ ක්‍රමයට තමයි අපි මේ පින්වතුන්ට කියලා දෙන්නේ, ඉදිරිපත් කරන්නේ.

පටිච්චසමුප්පාදයේ තිබෙනවා ඉගැන්වීම් ක්‍රම දෙකක්. අනුලෝම ක්‍රමය සහ පටිලෝම ක්‍රමය. හොඳට මේක හුරුවෙන්න ඕනෑ. ධර්ම දේශනාවක් ඇසූ ප්‍රමාණයට දැන ගන්නේ නැතුව හිතට හොඳට කැවෙන්න තහවරු වෙන්න දැන ගන්න ඕනෑ. අනුලෝම ක්‍රමය කියන්නේ මොකක්ද? හටගන්නා විදිය කියලා දෙන ක්‍රමය. පටිලෝම ක්‍රමය කියලා කියන්නේ නැති වීමේ ක්‍රමය කියලා දෙන එක.

කොහොමද අනුලෝම ක්‍රමයයි පටිලෝම ක්‍රමයයි දැන ගන්නේ? ඒක මෙහෙමයි තිබෙන්නේ.

- **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා**
- **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**
- **විඤ්ඤාණ පච්චයා නාමරූපං**
- **නාමරූප පච්චයා සළායතනං**
- **සළායතන පච්චයා ඵස්සෝ**
- **ඵස්ස පච්චයා වේදනා**
- **වේදනා පච්චයා තණ්හා**
- **තණ්හා පච්චයා උපාදානං**
- **උපාදාන පච්චයා භවෝ**
- **භව පච්චයා ජාති**
- **ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ** ආදී වශයෙන්.

මේ විදියට කියාගෙන යන එකෙන් කියන්නේ ඒ ඒ ධර්ම මේ මේ කාරණයෙන් ඇතිවෙනවා හට ගන්නවා කියන එකයි. ඒක නිසා මේ කොටසට කියනවා අනුලෝම ක්‍රමය කියලා. ඒ කියන්නේ මේ හේතුවෙන් මේ ප්‍රත්‍යයෙන් හට ගන්නවා කියලා.

පටිලෝම ක්‍රමය කියලා කියන්නේ නැතිවී යන ක්‍රමය. ඒ තමයි **- අවිද්‍යා නිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා**

**ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති.** මේ විදියට තමයි පටිලෝම ක්‍රමය යන්නේ.

දැන් ක්‍රම දෙකක් තිබෙනවා. අපි ඉස්සෙල්ලාම දැන ගන්න ඕන මෙයින් අනුලෝම ක්‍රමය. අනුලෝම ක්‍රමය උගන්වන කොට තිබෙනවා ක්‍රම කීපයක්. ඒ තමයි අපි ඉස්සෙල්ලාම හඳුනාගන්න ඕනෑ මේකේ අංග කීයක් තිබෙනවාද කියලා. අංග 12 ක් තිබෙනවා. ඒ තමයි **අවිද්‍යාව - සංඛාර - විඤ්ඤාණ - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා - තණ්හා - උපාදාන - භව - ජාති - ජරාමරණ** කියන අංග 12. මේ ධර්ම එක සමාන නෑ. දැන් **අවිද්‍යාව** වෙනයි **සංඛාර** වලට. **සංඛාරය** වෙනයි **විඤ්ඤාණයට. විඤ්ඤාණය** වෙනයි **නාමරූප** වලට. **නාමරූප** වෙනයි **සළායතන** වලට. **සළායතන** වෙනයි **ඵස්සයට. ඵස්සය** වෙනයි **වේදනාවට. වේදනාව** වෙනයි **තණ්හාවට. තණ්හාව** වෙනයි **උපාදානයට. උපාදානය** වෙනයි **භවයට. භවය** වෙනයි **ජාති ජරාමරණ** වලට. ඔය වගේ මේ ධර්ම එකිනෙකට වෙනස්.

¾ පිරිලා තිබෙන පොල්තෙල් බෝතලේකට තව පොල්තෙල් ටිකක් දැම්මහම ඒක පිරෙනවා. එතකොට අපිට හොඳට පේනවා පොල්තෙල්ම වැටිලා බෝතලය පිරිලා තිබෙනවා කියලා. අපි ඒ පොල්තෙල් බෝතලේටම වතුර ටිකක් දැම්මොත් මොකද වෙන්නේ. පොල්තෙල් උඩට එනවා වතුර යටට යනවා. එතකොට ඒකෙ තිබෙනවා වෙනසක්. පොල්තෙලුත් දියරක් වතුරත් දියරයක්. ඒවා දියර ගතියෙන් සමාන උනාට පොල් තෙල් වෙනයි වතුර වෙනයි.

හැබැයි බොතල් දෙකක තිබුණත් පොල් තෙල් දියරයක්. නමුත් ඒවා එකකට දැම්මොත් ඒවා සමාන නිසා අපිට ඉස්සෙල්ලා තිබුණ පොල්තෙල් මොනවාද අලුතෙන් දාපු පොල්තෙල් මොනවාද කියලා එහෙම හඳුනා ගන්න ලෙසියක් වෙන්නේ නෑ. ඒවගේ සමහර ධර්ම තිබෙනවා එක සමාන වෙන්නේ නෑ. සමාන උනේ නැති උනාට ඒවා එකින් එකට අනිත් ඒවාට උදව් වෙනවා, උපකාර වෙනවා.

දැන් බලන්න ගඩොලයි සිමෙන්තියි වෙනස්. නමුත් මේ වෙනස් වෙච්ච ගඩොලක් පිළිවෙලකට දරා ඉඳීමේ ශක්තිය තිබෙනවා සිමෙන්ති බදාම වලට. ඒවගේ අවිද්‍යාව වෙනයි සංස්කාර වලට, සංස්කාර වෙනයි විඤ්ඤාණයට. මෙසේ ලක්ෂණ වලින් වෙනස් උනාට වෙනත් ධර්මයකට පහළ වෙන්න වෙනත් ධර්මයක් ඇතිවෙන්න රඳා සිටින්න ඒකට පුළුවන් උදව් කරන්න. අපි ඒකත් දැන ගන්න ඕනෑ. තේරුම් ගන්න ඕනෑ.

තව එකක් තිබෙනවා, මෙන්න මෙහෙම. සංස්කාරයෝ වෙනයි අවිද්‍යාව වෙනයි. අවිද්‍යාව සංස්කාරයන්ට සමාන භාවයෙනුත් හේතු වෙනවා, අසමාන භාවයෙනුත් හේතු වෙනවා. අවස්ථා වෙනස් වීම වශයෙනුත් හේතු වෙනවා. ඒක නිසා මේක හරිම ප්‍රශ්නයක්.

අවිද්‍යාව කියන්නේ මොකක්ද? නොදන්නා කම - නොතේරෙන කම - අන්ධ බව.

මොනවා ගැනද අන්ධ වෙන්නේ? මොනවා ගැනද නොදන්නේ? මොනවා ගැනද නොතේරෙන්නේ? දුක ගැන දන්නේ නෑ, දුකට හේතුව දන්නේ නෑ, නිරෝධය ගැන දන්නේ නෑ, නිවනට හේතුව ගැන දන්නේ නෑ. පූර්වාන්තය දන්නේ නෑ, අපරාන්තය දන්නේ නෑ, පූර්වාන්ත අපරාන්ත දෙක දන්නේ නෑ, පටිච්චසමුප්පාද ධර්මයන් දන්නෙත් නෑ. මේ ටික කිව්වහම අපි දන්නේ නැති ඔක්කෝම ටික මේක ඇතුලේ තිබෙනවා. ඉතිං අද මේ පින්වතුන්ට ඊළඟට කියන්න තිබෙන දේට කලියෙන් මේ කාරණය පොඩ්ඩක් මතක් කරලා දෙන්නම්. ඒ තමයි

1. ස්ථානය
2. ස්වභාවය
3. කෘත්‍යය

අපි මේ ගැන සරල විදියට දැන ගමු. මේ වෙලාවේදී යම් කිසි දෙයක් කළොත් ඒකෙ විපාකය ඒකෙ ප්‍රතිඵලය එන්නේ පස්සේ. අපි හිතමු මෙහෙම. මේ රටේ ඉඳන් කෙනෙක් යම්කිසි වැරදි වැඩක් කරනවා. වැරදි වැඩේ කළේ මේ ස්ථානයේ. ඊට පස්සේ ලංකාවට ගියහම ඒකෙ ප්‍රතිඵල එනවා. දැන් එතකොට බලන්න වැඩේ කළේ මෙහෙදී. ඒකෙ විපාකය ආවේ ලංකාවේදී. එකම තැනද? නෑ. එකම තැන නොවෙයි. එතකොට මෙහෙ යම්කිසි දෙයක් කළොත් ඒක මෙහෙදී ප්‍රතිඵල දෙනවා විපාක දෙනවා කියනකොට ස්ථාන වශයෙන් ගත්තහම එකයි. නමුත් දැන් වෙන්නේ ස්ථාන දෙකක. ස්ථාන දෙකක උනාට කාලෙත් වෙනස්. මේ ස්ථානයේදී කලින් සිද්ධ වෙනවා එහෙට යනකොට පහුවෙනවා. නමුත් ස්ථානය වෙනස් උනාට මේ ස්ථානයේ කරපු දේ තවත් ස්ථානයකට බලපාන්න පුළුවන් ගතියක් තිබෙනවා. ඒකට කියනවා **‘ස්ථානයන්ගේ වෙනස් බව දැන ගන්න’** කියලා. දැන් අවිද්‍යාව පහළ උනොත් මෙතැන අනිත් පැත්තට ස්ථාන වශයෙන් බලපානවා.

අපි හිතමු මේ වේලාවේ කෙනෙක් මනුස්සලෝකයේ නවසීලන්තයේ ඉඳගෙන යම් කිසි වැරදි වැඩක් කරනවා. ඊට පස්සේ අපි ගිහිල්ලා උපදිනවා කසකස්ථානයේ. එහෙ ඉපදුනාට පස්සේ මෙහෙ තිබෙන දේ එහෙට බලපානවා. නවසීලන්තයේ සිද්ධ කරපු දේ විපාක දෙන්නේ වෙන තැනක. එහෙමනම් ආත්ම දෙකක්නේ. ඒක නිසා අවිද්‍යාවට පුළුවන් මෙතැන මතු උනාට කලින් වෙන තැනක හිටියට ඒක බලගන්නන්න පුළුවන්, වෙන තැනකට අදින්න පුළුවන්. ඒවගේ සංස්කාරයෝ වෙන තැනක පහළ වෙන්නේ, අවිද්‍යාව වෙන ආකාරයකට පහළ වෙන්නේ නමුත් වෙන තැනක උනාට අවිද්‍යාවට පුළුවන් අනිත් එක්කෙනාට බලපෑමක් කරන්න. ඔන්න ඔය කාරණය තමයි කියන්න ඕනෑ. ඒක නිසා ස්ථානය වෙනස් උනාට ප්‍රශ්නයක් නෑ.

අනිත් එක තමයි **‘ස්වභාවය’**. හොඳට බලා ගන්න, අවිද්‍යාවේ ස්වභාවය මොකක්ද? ඇත්ත වහනවා. නියම ස්වභාවය වහනවා. ඇත්ත පේන්න දෙන්නේ නෑ. නමුත් සංස්කාරයන්ගේ තිබෙන්නේ එකතු කරන රැස් කරන ගතිය. රැස් කරනවා කියන එකයි නොපෙන්නනවා කියන එකයි දෙකම එකද? නෑ. අවිද්‍යාවේ ස්වභාවය වෙනස්. ඒ වගේම සංස්කාරයන්ගේ ස්වභාවය වෙනස්. ඒක නිසා කියනවා අවිද්‍යාව උදව් කරනවානම් ඒ වගේ එහෙකට තමයි උදව් කරන්නේ. ස්වභාව වශයෙන් ගත්තහම අවිද්‍යාවේ ස්වභාවය වෙනයි සංස්කාරවල ස්වභාවය වෙනයි. විඤ්ඤාණයේ

ස්වභාවය වෙනයි. ඒවා එහෙම වෙනස් උනාට අනිත් එහෙකට බලපවත්වන්න බලගන්නවන්න පුළුවන්.

ඊළඟට **'කෘත්‍යය'** ස්වභාවය. කෘත්‍යය කිව්වහම අවිද්‍යාවේ කෘත්‍යය වෙනස්. සංස්කාරයන්ගේ කෘත්‍යය වෙනස්. විඤ්ඤාණයේ කෘත්‍යය වෙනස්. වේදනාවේ කෘත්‍යය වෙනස්. නාම රූපයන්ගේ කෘත්‍යය වෙනස්. ඒ ගොල්ලන්ගේ වැඩ කටයුතු වෙනස්. තමන්ගේ වැඩේ එකක්, අනිත් එක්කෙනාගේ වැඩේ වෙන එකක් උනාට එක ධර්මයකට වෙනත් එකකට උදව් කරන්න පුළුවන්. එහෙම ස්වභාවයක් තිබෙනවා.

ඒක නිසා අපි දැන ගන්න ඕනෑ **ස්ථාන** වශයෙන් වෙනස් උනාට ප්‍රශ්නයක් වෙන්නේ නෑ. **ස්වභාව** වශයෙන් වෙනස් උනාට ප්‍රශ්නයක් වෙන්නේ නෑ. **කෘත්‍යය** වශයෙන් වෙනස් උනාට ප්‍රශ්නයක් වෙන්නේ නෑ.

දැන් සංස්කාර වශයෙන් කීයක් කිව්වද? **පුණ්‍යාභිසංස්කාර - අපුණ්‍යාභිසංස්කාර - ආනෙඤ්ජාභිසංස්කාර.**

මම ඕක සිත් වශයෙන් කියලා දුන්නා.

**පුණ්‍යාභිසංස්කාර** = කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර සිත් 5 ( සිත් 13)
**අපුණ්‍යාභිසංස්කාර** = අකුසල සිත් 12
**ආනෙඤ්ජාභිසංස්කාර** = අරූපා වචර කුසල් සිත් 4

ඔක්කොම සිත් 29 තිබෙනවා. මේ සිත් 29 යටම කියනවා **සංඛාර** කියලා. මේ සිත් 29 යම හටගන්නේ **අවිද්‍යාව** නිසා. අවිද්‍යාව නිසා සකස්කරන සකස්කිරීම් 29 පොළකම තිබෙනවා. ඒ 29 දෙනා තමයි අපි ගොඩවල් තුනකට වෙන් කරන්නේ **පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනෙඤ්ජාභිසංස්කාර** කියලා.

මේ **අවිද්‍යාව** වැටෙන්නේ පුණ්‍ය කොටසටද? අපුණ්‍ය කොටසටද? ආනෙඤ්ජ කොටසටද? අවිද්‍යාව මේ ගොඩවල් තුනටම හේතු වෙනවා නමුත් මේ ගොඩවල් තුනෙන් අවිද්‍යාව වැඩියෙන්ම කිට්ටු වෙන්නේ පුණ්‍යාභිසංස්කාර වලටද? අපුණ්‍යාභිසංස්කාර වලටද? ආනෙඤ්ජාභිසංස්කාර වලටද? **අපුණ්‍යාභිසංස්කාර** වලට. අවිද්‍යාව කියලා කියන්නේ අකුසල් පැත්තේ තිබෙන එකක්. අකුසලයකට අකුසලයක් කිට්ටු නම් ඉතින් කමක් නෑ, රා බොන මනුස්සයා රා බොන මනුස්සයාට කැමතියි කියල කියනවා. රා බොන මනුස්සයා කොහොමද හිතවත් කමක් පවත්වන්නේ දානේ දෙන මනුස්සයත් එක්ක. ඒක ටිකක් අමාරු වැඩක්. ඒ කාරණය දැන ගන්න ඕනෑ.

දැන් අපුණ්‍යාභිසංස්කාර වලට අවිද්‍යාව බලපවත්වනවා, ඒක ඒගොල්ලන්ගෙම එක්කෙනෙක්. කොහොමද **අපුණ්‍යාභිසංස්කාර** වලටයි **ආනෙඤ්ජාභිසංස්කාර** වලටයි **අවිද්‍යාව** බලපවත්වන්නේ කියලා තේරුම් ගන්න ඕනෑ. ඒක තමයි ආමාරු.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ආනෙඤ්ජාභිසංස්කාර කියන්නේ මොනවාද?

<u>පිළිතුර</u> - ආනෙඤ්ජාභිසංස්කාර කියන්නේ අරූපාවචර කුසල් සිත්.

අරූපාවචර බ්‍රහ්මලෝකයේ උපදින්න පුළුවන්ද නිකං? බෑ. රූපාවචර ධ්‍යාන වලින් අරූපාවචර බ්‍රහ්මලෝකයේ උපදින්න පුලුවන්ද? බෑ. කාමාවචර සිත් වලින් උපදින්නත් බෑ. අරූපාවචර ධ්‍යාන උපදවන්න ඕනෑ. මෙහෙදී අරූපාවචර ධ්‍යාන උපදිව්වොත් තමයි එහෙ උපදින්න පුළුවන්කම තිබෙන්නේ. එහෙ ගිහිල්ලා මොකක්වත් කරන්න බෑ. ඒක නිසා මෙහෙදී උපදවන්නා වූ අරූපාවචර ධ්‍යාන සිත් වලට කියනවා **ආනෙඤ්ජාභිසංස්කාර** කියලා. ඇත්ත වශයෙන්ම අරූපාවචර කුසල් සිත් හතරක් තිබෙනවා.

1. **ආකාසානඤ්චායතනය**
2. **විඤ්ඤාණඤ්චායතනය**
3. **ආකිඤ්චඤ්ඤායතනය**
4. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** කියන අරූපාවචර ධ්‍යාන සිත් හතරට තමයි කියන්නේ **ආනෙඤ්ජාභිසංස්කාර** කියලා. මේකට **ආනෙඤ්ජාභි** කියලා කියන්නේ නොසැලෙන අර්ථයෙන්. වෙනත් බාහිර ප්‍රතිවිරුද්ධ අකුසල් අරමුණු වලින් හොලවන්න බෑ. එහෙම හෙලවෙන්නේ නැති අර්ථයෙන් තමයි **ආනෙඤ්ජා** කියලා කියන්නේ. නැත්නම් ඒවා සිත් වශයෙන් ගත්තහම අනිත්‍යය ගතිය තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **ආනෙඤ්ජ** කියන එකේ තේරුම?

<u>පිළිතුර</u> - අපි **ආකාසානඤ්චායතනය** ගමු. ආකාස සංඥාව තිබෙනවා. **ආකාසානඤ්චායතන** ධ්‍යාන සිතක් තිබෙන එක්කෙනාට අනිත් අරමුණු ඔය ගස් කොළං දැක්කට එයාට ඒකෙන් ධ්‍යානය නැතිවෙලා විනාස වෙලා යන්නේ නෑ. ඒ තරමට එයාගේ හිත කිඳා බහිනවා අර ආකාස සංඥාවට. **ආනෙඤ්ජ** කියන කොට අන්න එහෙම එකක් තිබෙන්නේ. අනිත් ඒවගෙන් සෙලවෙන්නේ නෑ.

ඊළඟට, මනුස්සයෙක් දෙවියන්ට පූජාවක් කරන්න කුකුළෙක් මරණවා. ඒ පූජාව කරන්නේ නිරෝගී භාවය සලකාගන්න. මොකක් හරි අපලයක් හෝ සෙනසුරු ග්‍රහයාගෙන් හරි වෙනත් ග්‍රහයෙකුගෙන් හරි ඇති වෙච්ච බලපෑමක් ගැන හිතාගෙන එයාගෙන් බේරෙන්න එයා යාළු කරගන්න එයාගෙන් කරදරයක් නොවෙන්න මෙයා යාගයක් හරි පූජාවක් හරි සංවිධානය කරනවා. ඒකට ගන්නවා කුකුළෙක්. එයා ඒ කුකුළා මරණවා. ඒ කුකුළා මරණකොට එතැනදී එයාට සිද්ධ වෙන්නේ මොන අකුසලේද? ප්‍රාණඝාත අකුසලය සිද්ධ වෙනවා. එතකොට ඒක අකුසල් සිත් 12 න් ද්වේශ මූලික සිතක්. එයා ලෝභ කරනවා නිරෝගී භාවයට. නිරෝගී භාවයට ආස කරලා නිරෝගී භාවය ඇති කරගන්න ආසාවක් ඇතිකරගෙන කෲර සිතකින් සත්වයෙක් මරණවා.

දැන් එයාට ඇති උනේ මොකක්ද? එයාට **අපුඤ්ඤාභිසංස්කාර** එක්කාසු උනා. අපුඤ්ඤාභිසංස්කාර කියන්නේ පාප කර්මයක්. ඒ පාප කර්මය රැස් වෙනකොට අකුසල් සිතක් පහළ වෙනකොට ඒකට මොකක්ද හේතු උනේ? **අවිද්‍යාව.**

එයා සෙනසුරු ග්‍රහයා ගැන දන්නෙත් නෑ. සෙනසුරුගෙන් එයාට ඇතිවෙලා තිබෙන විපත කවදද උනේ කියලා දන්නෙත් නෑ. සෙනසුරු ගැන දන්නවා කියලා කියන මනුස්සයෙක් එයාට කියනවා සෙනසුරුගෙන් අපලයක් තිබෙනවා, ඒක නිසා මේ වගේ පූජාවක් කරන්න කියලා. එයා කිසිම විපරමක් නැතුව වෙන මනුස්සයෙක් කියන දෙයක් පිළිගන්නවා. එයාට තිබෙන රෝගය සෙනසුරු නිසා ඇති උනාද නැත්නම් එයා පිළිබඳව විස්තර කරපු එක්කෙනා නිසා ඇති උනාද නැත්නම් විස බීජයක් ගිහිල්ලද කියලා ලෙඩේ හැදිච්ච විදිය මොකක්වත් දන්නේ නෑ. ලෙඩේ හැදෙන්න හේතු වෙන්න ඇත්තේ සමහර විට මොකක් හරි කාපු එකක් නිසා වෙන්න පුළුවන් නමුත් නම යන්නේ සෙනසුරු ග්‍රහයාගේ. බෙහෙත් හදන්න කාගේද බෙල්ල යන්නේ? කුකුළාගේ. එහෙම නේද?

එතකොට දැන් බලන්න මේ පරාසය පිළිබඳව දැනුමක් නෑ. එතකොට මෙයා නිරෝගී භාවය ප්‍රාර්ථනා කරගෙන අපල උපද්‍රව නැති කරගන්න හොයන විදිය යහපත් විදියක්ද, එහෙම කුකුළෝ මරලා නිරෝගී වෙන්න පුළුවන්ද, කී දෙනෙක් එහෙම නිරෝගී භාවයට පත්වෙලා තිබෙනවාද කියලා විපරම් කරන්නේ නෑ. සමහරු එළුවෝ මරණවා. බෞද්ධයෝ නම් සත්තු නිදහස් කරනවා.

දැන් මේ අකුසල පැත්ත ගත්තහම **අවිද්‍යාව** නිසා නේද මේ ඔක්කොම සංස්කාර ටික මෙයාට ඇති උනේ. ඒක පැහැදිලියි. අන්න ඒක නිසා කියනවා **අවිජ්ජා පච්චයා අපුඤ්ඤාභිසඞ්ඛාරා** කියලා. දැන් ඒක පැහැදිලියි.

එයා දැන් නිරෝගී භාවයට යාගහෝමයක් කළා. පූජාවක් කළා. දැන් **අපුඤ්ඤාභිසංස්කාර** ටිකක් තිබෙනවා. ඊළඟට මෙයාට කොහොම හරි බණ අහන කෙනෙක් හම්බ වෙනවා. එයා එයාට කියලා දෙනවා එයා කළ දේ ලොකු බොරුවක් කියලා එයාට හරි පිළිවෙත කියලා දෙනවා. සත්පුරුෂයන්ගේ ආශ්‍රය ලබන්න ප්‍රාර්ථනා කරන්න කියලා දිව්‍යලෝක වල තිබෙන සැප සම්පත් ගැන කියලා දාන සීල ආදී පිංකම් කරන්න කියලා දෙනවා. එයාට මේවා අහගෙන ඉන්නකොට හරි සතුටක් ඇතිවෙනවා. එයා ඊට පස්සේ සියලුම පිං කරමින් සංස්කාර උපදවනවා දිව්‍යලෝකයේ යන්න.

ඒ විදියට පිංකම් කරමින් ඉඳලා එයා ගිහිල්ලා උපදිනවා දිව්‍යලෝකයේ දිව්‍ය මණ්ඩලයේ ප්‍රධානියකුට යටත්ව. අපි බොහොම මහන්සි වෙලා දාන මාන පිංකම් කරගෙන ඒ පිනේ බලයෙන් මනුස්සලෝකයේ ඉපදුනත් කාටහරි අම්මා කෙනෙකුට යටත්ව තාත්තා කෙනෙකුට යටත්ව තමයි ඉන්න වෙන්නේ. මොන තරම් පිං රැස් වෙලා තිබුණත් අම්මටයි තාත්තටයි මෙල්ල වෙලා ජීවත් වෙන්න ඕනෑ. මෙහෙ ඉඳලා දිව්‍යලෝකයට ගියහමත් එහෙ ඉන්න දෙවි කෙනෙකුට යටත්ව සේවකයෙක් හරි සමාජිකයෙක් හරි විදියට එයාට එහෙදි සේවාවක් නියම වෙනවා. එයාගෙ පිනෙන් කන්න බොන්න ලැබුණට ඒ වැඩ ටික එයා කරලා දෙන්න ඕනෑ. දැන් මාතලී දිව්‍ය පුත්‍රයා උනත් දිව්‍යලෝකයට ගියේ පිං කරලා. නමුත් එයාට එහෙ කරන්න duty යක් තිබෙනවා. ශක්‍රදෙවියන්ට කොහේ හරි යන්න ඕන උනහම එයා වාහනය ලෑස්ති කරන්න ඕනෑ. එයාට ඒවෙලාවට නන්දන උයනට යන්න අවශ්‍ය උනත් එහෙම

කරන්න නිදහස නෑ. ඒවගේ දිව්‍ය ලෝකයේ ගියත් තව කෙනෙක් යටතේ ඉන්න වෙනවා. අනිත් එක ඒ සැප සම්පත් සදාකාලිකත් නෑ.

නැවතත් එයා මනුස්සලෝකයට එනවා. ඇයි එහෙම ආවේ? දිව්‍ය සැපත් අස්ථිර නිසයි. මනුස්සලෝකයට එන්නෙත් ඒ කරපු පිනෙන්මයි. ඉතුරු පිනෙන් මනුස්සලෝකයට ආවහම එතැනත් හෙම්බිරිස්සවෙන් පටන් ගත්තහම දත් රෝග කන් රෝග ආදී අනිකුත් සියලුම ලෙඩ දුක් ඒවගේම කඩේ යන්න අතුපතු ගාන්න ආදී නොයෙකුත් ඉවරයක් නැති වැඩ කටයුතු සමග මහා කරදර ගොඩක් මෙයාට ලැබෙනවා. ඒවගේම සෑම අවශ්‍ය දෙයක්ම ලබාගන්න වැඩ කරන්න වෙනවා. එයාට මේ සකලමනා දුක්ඛ ස්කන්ධයක්ම එකතු වෙනවා. මේ සියලුම දේවල් වල හිත ගැටි ගැටී ගැටි ගැටී ජීවත් වෙන්න වෙනවා. දැන් බලන්න එයා මේ මනුස්සලෝකයට ආවේ පිනක් කරලයි. ඒවගේම එයා පෙර ජීවිතියක අර සෙනසුරු පූජාවකට කුකුළෙක් මරපු අකුසල විපාකයත් දැන් මේ මනුස්සලෝකයෙදී එනවා. දැන් මේ දුක් ගොඩ පිළිබඳව එයා දැනගෙන හිටියේ නෑ පිං කරන කොට. එයා වෙන කවුරුහරි කියන දෙයක් අහගෙන තමයි ඒ පුණ්‍යාභිසංස්කාර රැස් කළේ. පුණ්‍ය ගතියක් හොඳ ජීවිතියක් උනාට එතැන කිසිම ස්ථිර ගතියක් නෑ.

දැන් මේක අපෙන්ම බලා ගන්න පුළුවන්. අපිත් මනුස්සලෝකයට අවේ පිනෙන්. ඒ උනාට ජේනවා නේද දැන් පිනෙත් වෙලා තිබෙන හරිය. ඒවගේ මේකෙ තිබෙන දුක්ගොඩ අපි එයාට කියලා දුන්නේ නෑ. කියලා දුන්නත් එයාට තේරෙන්නෙත් නෑ. ඒක නිසා එයා පිං කරමින් පුණ්‍යාභිසංස්කාර රැස් කළා දිව්‍යලෝකයට යන්නයි මනුස්සලෝකයට එන්නයි, නිවන් දකින්න නොවෙයි. මේ ප්‍රතිඵලයේ නොදන්නාකම මුල් වෙලා අවිද්‍යාව මුල්වෙලා පිං කරපු විදිය තමයි ඔය කිව්වේ. ඒක නිසයි කියන්නේ **අවිජ්ජා පච්චයා පුණ්‍යාභිසඞ්ඛාරා** කියලා. අපිට ලබාදෙන එකක්වත් ස්ථිර නෑ. ඒ ලබාදෙන හැම එකේම අඩුපාඩු තිබෙනවා. මහා විසාල මාළිගාවල් පිනෙන් ලබලා දෙනවා. ඒ උනාට ඒ පිං මකුළුවෝ ගණන් ගන්නේ නෑ. අපේ පින වවුළු ගණන් ගන්නෙත් නෑ. අපේ පිං පරෙයියෝ ගණන් ගන්නේ නෑ. ඔය ඔක්කොම ඇවිල්ල මාළිගාවේ ජරා කරනවා. ඊට පස්සේ වතුර දදා සුද්ද කරන්න වෙනවා. නමුත් ගේ කාගේද? අපේ, පිනට හම්බ උනේ. අපිට පුණ්‍යාභිසංස්කාර හදන්න අවිද්‍යාව හේතු වෙන්නේ ඔන්න ඔය විදියටයි. ඔය විදියටයි අපි තේරුම් ගන්න ඕනෑ.

අනිත් එක තමයි මේ කිසිම දෙයක් නිකං හම්බවෙන්නේ නෑ. මහන්සි වෙන්න ඕනෑ. අපිට පිං රැස් කරන්න ඕනෑ උනහම අපිට නිකම්ම ගිහිල්ලා බෝධිය ඉස්සරහ වාඩි වෙන්න බෑ. තෙල් මල් හදාගෙන වාහනයක් හොයගෙන නිවාඩු දාගෙන එන්න ඕනෑ. ඒවා ඔක්කොම අපි මහන්සියෙන් කරන්න ඕනෑ. ඒ ඔක්කෝම ටිකත් අවිද්‍යාව නිසා තමයි ඇතිවෙන්නේ. ඒවගේම අපි හිතමු බිස්නස් කරන කෙනෙක් ගැන. එයාට සල්ලි හම්බවෙන ඇත්ත, අපි හිතමු වඩේ කාරයෙක් කඩල කාරයෙක් කියලා. එයා මනුස්සලෝකයට ආව, හොඳ නෝනා කෙනෙක් හම්බ උනා දරුවොත් හම්බ උනා. නෝනා හොඳ උනාට දරුවෝ හොඳ උනාට එයාගේ දරු පවුල රක්ෂා කරන්න දාඩිය මුගුරු හෙලාගෙන උදේ පාන්දර නැගිටගෙන කරන්න මහා දුක්ඛස්කන්ධයක් තිබෙනවා. ඒ ඔක්කෝම ටික **අවිජ්ජා පච්චයා කුසලාභිසඞ්ඛාරා** හින්ද.

දැන් බලන්න කුසල විපාකයේ ස්වභාවයයි, ඒ කුසල විපාකය ලබාදෙන තැන තිබෙන දුක්ඛස්කන්ධය නොපෙන්වා ඒ පිළිබඳව මතකයක් එන්න නොදී එතැනදී අවිද්‍යාව කරපු වැඩේ. නොයෙක් ආකාරයේ දේවල් කරලා ගොඩක් පිං රැස් කරගත්තා නමුත් ඒකෙ විපාකයේ මේ වගේ දුක් කම්කටොලු තිබෙනවා කියලා පෙන්නුවේ නෑ. ඒක නිසා කියනවා **අවිජ්ජා පච්චයා පුඤ්ඤාභිසඞ්ඛාරා** කියලා.

තව තිබෙනවා **ආනෙඤ්ජාභිසංස්කාර,** අරූපාවචර ධ්‍යාන සිත් 4. ආනෙඤ්ජාභිසංස්කාරත් ඒ වගේම තමයි. සදාකාලික ජීවිතියක් හොඳ ජීවිතියක් එතැනනට දාගන්න කුසල් සිත් හදනවා. ලොව්තුරා බුදුරාජාණන්වහන්සේගේ දේශනාවේ විතරයි ඒක ස්ථිර නෑ කියලා කියන්නේ. අනිත් ඒවගේ කියන්නේ ඒක හොඳ තැනක් එතැන තමයි හොඳම තැන කියලා. ඒක නිසා ඒ ගැන අහපු ගමන්ම අපිට හිතෙනවා එතැන ඇඟකුත් නෑ මුකුත්ම නෑ කියලා එතැනට යන්න ධ්‍යාන වඩනවා. ඊට පස්සේ ඒ ධ්‍යාන බලයෙන් එතැන උපදිනවා. හැබැයි එතන ස්ථිරත්වයක් නෑ. ආන්න ඒක නිසා ඒකටත් කියනවා **අවිජ්ජා පච්චයා ආනෙඤ්ජාභිසඞ්ඛාරා** කියලා.

දැන් තේරෙනවා නේද **අවිජ්ජා පච්චයා පුඤ්ඤාභිසඞ්ඛාර - අවිජ්ජා පච්චයා අපුඤ්ඤාභිසඞ්ඛාර - අවිජ්ජා පච්චයා ආනෙඤ්ජාභිසඞ්ඛාර** හැදෙන විදිය. මේක හොඳට පරෙස්සමෙන් තේරුම් ගන්න.

දැන් සංඛාර කියන කොට සිත් 29 තිබෙනවා. නමුත් මේ සංඛාර කියන එක වෙන තැනකට දාගන්න හොඳ නෑ. මේ විස්තරය ගැලපෙන්නේ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන තැනටයි.

දැන් මහා කළුගලක් තිබෙනවා. ඒ කළු ගලට අපි හයි කරනවා **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා. ඒක ගැලපෙනවද? නෑ. කිසිම ගැලපීමක් නෑ. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියලා කිව්වේ මොන අර්ථයෙන්ද, **සංස්කාරයෝ අනිත්‍යයයි** කිව්වේ මොන අර්ථයෙන්ද කියලා තේරුම් ගන්න ඕනෑ. ඒක නිසා මේ වචන සමාන උනාට ඒකෙන් කියන්නාවූ දේවල් එකම වෙන්නේ නෑ.

දැන් බලන්න මෙහෙම. නාසා ආයතනය කියලා ආයතනයක් තිබෙනවා. ඒ නාසා ආයතනයයි අපේ නාසා ආයතනයයි (Nose) දෙකක්. ඒක නිසා නාසයතනය කිව්වහම ඔක්කොම එක නොවෙයි. කවුරුහරි කිව්වොත් එයා වැඩ කරන්නේ නාසායතනයේ කියලා අපි තේරුම් ගන්න ඕනෑ කොතැනද කියලා. ඒවගේම තමයි තෙසැත්තා ඥානකථා සහ හපලා කන ඥානකතා කියන්නේ දෙකක්. ඥානකථා කියලා පොතක් තිබෙනවා. ඒක නිසා මේ වචන එක වගේ උනාට අපි රැවටෙන්න හොඳ නෑ. (Papua New Guinea) පපුවානිව්ගිනියා කියලා රටක් තිබෙනවා. පපුවේ ගිනි නිවූ නිසා ඒක පපුවානිව්ගිනියා උනා නොවෙයි. ඒක රටක්. මම මේවා කිව්වේ **සංඛාර** කියන වචනය ගැන කියන්න.

සංඛාර කියන කොට **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන එකයි **අනිච්චා වත සංඛාරා** කියන එකයි වෙනස්. ඒකයි තේරුම් ගන්න ඕනෑ.

මේ පටිච්චසමුප්පාදය තේරුම් ගන්න එකත් කෙනෙකුට අර්ථය පටලැවෙන්නේ නැතුව කියලා දෙනවා කියන එකත් හරිම අමාරු වැඩක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පුඤ්ඤාභිසඞ්ඛාර වශයෙන් ගත්තු රූපාවචර සිත් 5 න් සිදු වෙන වචී සංඛාරයි කාය සංඛාරයි මොනවාද?

<u>පිළිතුර</u> - අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කිව්ව ගමන් ඒක කොටස් තුනකට බෙදෙනවා, පුඤ්ඤාභිසඞ්ඛාර - අපුඤ්ඤාභිසඞ්ඛාර - ආනෙඤ්ජාභිසඞ්ඛාර කියලා. නැවතත් ඒක බෙදෙනවා කාය සංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර කියලා තුනකට.

හොඳට මේක තේරුම් ගන්න.

## <u>(1) පුඤ්ඤාභිසංඛාර</u>

1a). පුඤ්ඤාභිසංඛාර } **කාමාවචර කුසල් සිත් 8** / **රූපාවචර කුසල් සිත් 5** } **සිත් 13** } <u>**කාය සංඛාර**</u>

උදාහරණයක් හැටියට අපි හිතමු මනුස්සයෙක් පිං කරනවා. පිං සිතින් වන්දනා කරනවා, මල් කඩනවා බෝධියක් අතු ගානවා සංඝ උපස්ථාන කරනවා, වතුර කෝප්පයක් දෙනවා, උයනවා පිහනවා, දානේ හදනවා. මේ සියලුම දේ කරන්නේ කයින්. ඒක නිසා මේ වෙලාවට මේ පිං සිතුවිලිවලින් එයා ක්‍රියාත්මක කරන්නේ කය. ඒක නිසා ඒකට කියනවා කායසංඛාර කියලා. එතකොට මේ පිං **කායසංඛාරත්** වෙනවා, **පුඤ්ඤාභිසංඛාරත්** වෙනවා. මෙහිදී **පුඤ්ඤාභිසංඛාර** කියලා කිව්වේ සිතේ පහළ වෙන්නාවූ චේතනා වශයෙන්. **කායසංඛාර** කියලා කිව්වේ ඒ චේතනාව ක්‍රියාත්මක වෙන දොරටුව වශයෙන්.

1b). පුඤ්ඤාභිසංඛාර } **කාමාවචර කුසල් සිත් 8** / **රූපාවචර කුසල් සිත් 5** } **සිත් 13** } <u>**වචී සංඛාර**</u>

අපි හිතමු කෙනෙකුට පිරිත් පොතක් හම්බවෙනවා. ඒ පොතේ ලියලා තිබෙනවා ඒ පොත සජ්ඣායනා කිරීමෙන් ගාථා කීමෙන් මේ මේ සම්පත් ලැබෙනවා, ශ්‍රද්ධාව වැඩෙනවා, ප්‍රඥාව වැඩෙනවා, භවබෝග සම්පත් ලැබෙනවා, අපල උපද්‍රව දුරු වෙනවා, ග්‍රහ අපල දුරුවෙනවා කියලා. ඉතින් ඒ කෙනා බෝධීන් වහන්සේ ගාවට ගිහිල්ලා ඒක කියලා බුදුගුණ සජ්ඣායනා කරනවා, ඒවාගේම ඇත්ත කථා කරනවා. දැන් මේවා කරනකොට මොනවාද පහළ වෙන සිත්? එයාට **පුඤ්ඤාභිසංඛාර** පහළ වෙනවා. ඒවා නිකුත්

වෙන්නේ වචනයෙන්, ඒක නිසා ඇතිවෙන්නේ **වචීසංඛාර.** එතකොට ඒක **වචීසංඛාරත්** වෙනවා **පුණ්‍යාභිසංඛාරත්** වෙනවා.

1c). පුණ්‍යාභිසංඛාර }
**කාමාවචර කුසල් සිත් 8**
**රූපාවචර කුසල් සිත් 5**
} **සිත් 13** } **චිත්ත සංඛාර**

දැන් මෙයා හොඳට පිංකම් ටික කරගෙන සතුටින් හිත හිතා ඉන්නවා. 'දැන් මම වන්දනා කළා, දිව්‍යලෝකයේ යන්න පුළුවන්' කියලා ඒ පිංකම් පිළිබඳ හොඳට මනසිකාරයක් පවත්වාගෙන ඉන්නවා. එතකොට එයාට මේ කුසල් සිත් පහළ වෙනවා. දානයක් සංවිධානය කරනකොට හරි භාවනාවක් සංවිධානය කරනකොට හරි මොකක් හරි දෙයක් කරනකොට මේ පිං සිතුවිලි වලින් තමයි මෙයා ඒවා කරන්නේ. එයා ඒක කටින් කියන්නේ නෑ, වචනයෙන් කියන්නේ නෑ. කයින් ක්‍රියාත්මක වීමකුත් නෑ. ඒ ටික ඔක්කෝම වැඩ කරන්නේ සිතෙන්. එතකොට ඒවා **චිත්තසංඛාර** වෙනවා. එතකොට ඒවා **චිත්තසංඛාරත්** වෙනවා **පුණ්‍යාභිසංඛාරත්** වෙනවා.

## (2) අපුණ්‍යාභිසංඛාර

2a) අපුණ්‍යාභිසංඛාර } **අකුසල් සිත් 12** } **කාය සංඛාර**

කෙනෙක් මේ අකුසල් සිත් වලින් සත්තු මරණවා. එතකොට එයාගේ ඒ අකුසල සිත් ටික ක්‍රියාත්මක වී යන්නේ කයින්. එක නිසා ඇතිවෙන සංඛාර වලට කියනවා **කාය සංඛාර** කියලා. එතකොට ඒ සංඛාර **අපුණ්‍යාභිසංඛාරත්** වෙනවා. **කායසංඛාරත්** වෙනවා.

2b). අපුණ්‍යාභිසංඛාර } **අකුසල් සිත් 12** } **වචී සංඛාර**

දැන් කවුරු හරි මනුස්සයෙක් වැඳ වැඳ ඉන්න කෙනෙකුට බණිනවා. ඒ මනුස්සයා හැමෝටම දොස් කියනවා, කේලාම් කියනවා, බොරු කියනවා, රළු වචන කියනවා. ඒ සියලුම දේ සිද්ධ වෙන්නේ වචනයෙන්. නමුත් ඒ වචන නිෂ්පාදනය කරන්නේ සිතේ පහළ වෙන අකුසල් සිත් 12හ. ඒ හදන හදන සැර පිටවෙන්නේ වචනයෙන්. ඒක නිසා ඒ සංස්කාර **වචීසංඛාරත්** වෙනවා **අපුණ්‍යාභිසංඛාරත්** වෙනවා.

2c). අපුණ්‍යාභිසංඛාර } අකුසල් සිත් 12 } චිත්ත සංඛාර

කෙනෙක් අකුසලයක් කරන්න plan කරනවා. ඒක කටින් කියන්නේ නෑ. එතකොට එයාට මේ අකුසල සිත් 12 පහළ වෙනවා. ඒක හිතින් හිත හිතා ඉන්නකොට **චිත්තසංඛාර** ඇතිවෙනවා. ඒක නිසා ඒ සංස්කාර **චිත්තසංඛාරත්** වෙනවා **අපුණ්‍යාභිසංඛාරත්** වෙනවා.

## (3)ආනෙඤ්ජාභිසංඛාර

3) ආනෙඤ්ජාභිසංඛාර } රූපාවචර සිත් 4 } චිත්ත සංඛාර

අපිට සජ්ඣායනා කර කර අරූපාවචර ධ්‍යාන වඩන්න බෑ. අත්පුඩි ගගහා අරූපාවචර ධ්‍යාන වඩන්න බෑ. කය සංවර කරගෙන වචනය සංවර කරගෙන කිසිවක් කථා කරන්නේ නැතුව හොඳ සමාධිගත සිතකින් තමයි අරූපාවචර ධ්‍යාන වඩන්න ඕනෑ වෙන්නේ. ඒක නිසා එතැනදී **ආනෙඤ්ජාභිසංඛාර** සියල්ලම **චිත්තසංඛාර** පමණයි. ආනෙඤ්ජාභිසංඛාර කායසංඛාර වෙන්නේ නෑ. ආනෙඤ්ජාභිසංඛාර චිත්තසංඛාර පමණයි.

දැන් මම කියලා දුන්නා අවිද්‍යාව නිසා කොහොමද පුණ්‍යාභිසංඛාර හැදෙන්නේ අවිද්‍යාව නිසා කොහොමද අපුණ්‍යාභිසංඛාර හැදෙන්නේ අවිද්‍යාව නිසා කොහොමද ආනෙඤ්ජාභිසංඛාර හැදෙන්නේ කියලා. ඊළඟට කායසංඛාර - වචීසංඛාර - චිත්තසංඛාර බෙදෙන විදියත් මම කියලා දුන්නා. ඊළඟට මම කියලා දුන්නා ස්ථාන වශයෙන් - ස්වභාව ධර්ම වශයෙන් - කෘත්‍යය වශයෙන් වෙනස් උනාට විපාක දෙනකොට අවිද්‍යාව සංස්කාරයන්ට බලපානවා කියල.

අනිත් එක තමයි ගොඩක් සත්වයන්ට තිබෙනවා මුලාවක්. සමහර අයට මරණය වෙනවා කියන එක පැහැදිලියි. සමහර අයට උප්පත්තිය ඇතිවෙන ජාතිය පැහැදිලියි. එතකොට ඒ අය මරණය ඇතිවෙනවා කියලා ගත්තහම තීරණයකට යනවා ආත්මය මේ ශරීරයෙන් ගිලිහිලා ගිහිල්ලා වෙන ශරීරයකට ඇතුල් වෙනවා, මේ ආත්මය කියන එක නොමැරී පවතිනවා, වෙනස් උනේ ඇඟ විතරයි කියලා දෘෂ්ඨියකට යනවා. මේ වගේ දෘෂ්ඨියකට කෙනෙක් පත්වෙන්නේ පටිච්චසමුප්පාදය දන්නේ නැති නිසයි. අනිත් එක තමයි උපදිනකොටත් මේ ආත්මය වෙන තැනකින් මේ ශරීරයට ඇතුල් උනා කියලා ඒක හේතුවක ඵලයක් හැටියට දකින්නේ නැතුව ආත්මයට භූමියක් හැටියට ඉදිරිපත් උනා කියලා දෘෂ්ඨියකට යනවා. පටිච්චසමුප්පාදය දකින්නේ නෑ. ඒක නිසා මේ පටිච්චසමුප්පාදය දැන ගැනීම උපකාරවෙනවා විශේෂයෙන්ම ආත්මයක් මෙතැනින් ගැලවිලා වෙන තැනකට යනවා කියන එක පැත්තකට දාලා **අනාත්මීය** ගතිය තේරුම් ගන්නත් වෙන තැනක

ඉඳලා ආත්මය මෙතැනට එනවා කියන අදහස පැත්තකට දාලා මේක හේතුවක ඵලයක් හැටියටයි සිද්ධ වෙන්නේ කියලා දැනගන්නත්. මේ හේතුඵල ධර්ම කියලා දෙන්නේ ඔන්න ඕකටයි. නැත්නම් එහෙම වෙන්නේ ආත්මීය දෘෂ්ඨියක් හදාගෙන ඒකෙ රැදෙනවා.

දැන් බුද්ධ දේශනාවල තිබෙන්නේ සිත සහ කය කියලා (Mind & Body). මේ රටවල් වල තිබෙන එකක් තමයි Mind Body & Spirit කියලා. මනසයි ඇඟයි spirit එක කියලා හරි soul කියලා හරි තව එකකුත් තිබෙනවා. Mind Body & Spirit හරි Mind Body & Soul කියලා හරි ගන්නේ කුමක් නිසාද? පටිච්චසමුප්පාදය නැති නිසයි. අපේ බෞද්ධ ඉගැන්වීම් වල තිබෙන්නේ නාම - රූප ධර්ම පිළිබඳව විතරයි. Mind Body & Soul තිබෙන තාක් කල් Mind Body & Spirit තිබෙන තාක් කල් නිර්වාණය ස්පර්ශ කරන වැඩේ කරගන්න බෑ.

ඊළඟට තිබෙනවා සංඛාර පච්චයා විඤ්ඤාණං.

සිත් ඔක්කොම තිබෙනවා 89. එයින් සිත් 29 සංඛාර. ඉතිරි සිත් තිබෙනවා 60.

මේ සංඛාර 29 නිසා විඤ්ඤාණ ඇතිවෙනවා = **සංඛාර පච්චයා විඤ්ඤාණං**

තව එකක් තිබෙනවා. ඇයි බුදුරජාණන්වහන්සේ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා කිව්වේ? සංඛාර විතරද අවිද්‍යාව නිසා පහළ වෙන්නේ? එහෙම නැත්නම් සංඛාර පහළ වෙන්න අවිද්‍යාව විතරද හේතු වෙන්නේ?

මේකට කරුණු 4 එනවා.

මේ සංස්කාරයෝ පහළ වීමට අවිද්‍යාව විතරක් නොවෙයි හේතු වෙන්නේ. තණ්හාව වීරිය ඇතුළු තව ගොඩක් සංඛාර තිබෙනවා. හැබැයි අනිත් ඒවා ඔක්කොම operate වෙන්නේ **අවිද්‍යාව** ප්‍රධාන හින්දයි. ඒක නිසා තමයි කියන්නේ සංස්කාර ඉපදීමට **අවිද්‍යාව** ප්‍රධාන හේතුවක් වෙනවා කියලා. ඒක නිසා මේ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන තැන ඒක හේතුක වෙන්නේ නෑ, බහු හේතුකව එන්නේ නමුත් **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන තැන සංඛාර හැදෙන වෙලාවට සංඛාරයන්ට ප්‍රධාන මූලික හේතුවක් වෙනවා **අවිද්‍යාව.** ඒකයි **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා තිබෙන්නේ.

දැන් මේ හැම එක්කෙනාගේම හිත හැම එක්කෙනාගේම මනස සංස්කාර මල්ලක් කියලා හිතන්න. බලන්න මේ සංස්කාර මලුවල මොනවාද තිබෙන්නේ කියලා. කායසංඛාර තිබෙනවාද? තිබෙනවා. වචීසංඛාර තිබෙනවද? තිබෙනවා. චිත්තසංඛාර තිබෙනවද? තිබෙනවා. පුඤ්ඤාභිසංඛාර තිබෙනවාද? තිබෙනවා. අපුඤ්ඤාභිසංඛාර තිබෙනවාද? තිබෙනවා. ආනෙඤ්ජාභිසංඛාර නම් නෑ.

එතකොට මේ පුඤ්ඤාභිසංඛාර ටිකටයි අපුඤ්ඤාභිසංඛාර ටිකටයි හේතු උනේ අවිද්‍යාව. මේ හැම එක්කෙනාගේම සිත් වල සංඛාර 29 න් 4 ක් හැර ඉතිරි 25 තිබෙනවා. දැන් මේ සංඛාර පච්චයා වලින් විඤ්ඤාණ වෙන්න ඕනෑ. විඤ්ඤාණය කියන එක දැන් කියලා

දෙනවා. ඒකට කියනවා **විපාක විඤ්ඤාණය** කියලා. **විපාක හැටියට එන විඤ්ඤාණයට කියනවා විපාක විඤ්ඤාණය කියලා.**

| | | |
|---|---|---|
| චක්ඛු විඤ්ඤාණ | 2 | අකුසල විපාක + කුසල විපාක |
| සෝත විඤ්ඤාණ | 2 | අකුසල විපාක + කුසල විපාක |
| ඝාණ විඤ්ඤාණ | 2 | අකුසල විපාක + කුසල විපාක |
| ජිව්හා විඤ්ඤාණ | 2 | අකුසල විපාක + කුසල විපාක |
| කාය විඤ්ඤාණ | 2 | අකුසල විපාක + කුසල විපාක |
| මනෝ විඤ්ඤාණ | 2 | කුසල විපාක මනෝධාතු + අකුසල විපාක මනෝධාතු = සම්පටිච්ඡන සිත් 2 |
| සන්තීරණ සිත් | 3 | කුසල 2 + අකුසල 1 |
| කාමාවචර කුසල විපාක | 8 | සහේතුක කුසල විපාක සිත් 8 |
| රූපාවචර විපාක | 5 | |
| අරූපාවචර විපාක | 4 | |

+ 32

මේ සිත් 32 පහළ වෙන්නේ කුමක් නිසාද? අර අපි හදාගත්තු සංස්කාර නිසා. **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියනකොට මේ වගේ පහළ වෙනවා විපාක සිත් 32ක්.

- ඔක්කොම විපාක සිත් තිබෙනවා 36 ක්. නමුත් ඵල සිත් 4 මෙයින් අයින් කරලා තිබෙන්නේ. ඒ ඵල සිත් හතර සංඛාර පච්චයා විඤ්ඤාණං නොවෙන නිසා ඒවා අයින් කරනවා.

ඊළඟට අපි තේරුම් ගන්න ඕනෑ විපාක විඤ්ඤාණ 32 මේ විදියට තිබුණාට මේක ගොඩවල් දෙකකට බෙදන්න ඕනෑ. මේ සිත් **ප්‍රතිසන්ධි විපාක** සහ **ප්‍රවෘත්ති විපාක** වශයෙන් විපාක දෙන ක්‍රම දෙකක් තිබෙනවා.

1. ප්‍රතිසන්ධි විපාක
2. ප්‍රවෘත්ති විපාක

} විපාක සිත් 32

1. ප්‍රතිසන්ධි විපාක කියලා කියන්නේ අපි ජීවිතයක් අතහැරලා ඊළඟ ජීවිතියේ ඉස්සෙල්ලාම උපදිනකොට ඒ උප්පත්තිය ලබා දෙවන්න ඉස්සෙල්ලාම ඉදිරිපත් වෙන 'සිත' වශයෙන් **ප්‍රතිසන්ධි සිත** කියලා කියනවා. ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණ තිබෙනවා.

2. අනිත් එක ඉපදුනාට පස්සේ, ප්‍රතිසන්ධිය ගත්තට පස්සේ ඇතිවෙනවා **ප්‍රවෘත්ති විපාක.**

දැන් මේ වෙලාවේදී **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කිව්වහම අපිට පහළ වෙන්නේ ප්‍රවෘත්ති විපාක. නමුත් **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා ප්‍රධාන වශයෙන් ගන්නේ **ප්‍රතිසන්ධි අවස්ථාව.**

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ප්‍රතිසන්ධියේදී සිත් 32 උපදිනවද?

<u>පිළිතුර</u> - නෑ.

- චක්ඛු විඤ්ඤාණ සිත් 2 + සෝත විඤ්ඤාණ සිත් 2 + ඝාණවිඤ්ඤාණ සිත් 2 + ජිව්හා විඤ්ඤාණ සිත් 2 + කාය විඤ්ඤාණ සිත් 2 යන සිත් 10 = **ප්‍රවෘත්ති විපාක**
- මනෝ විඤ්ඤාණ 2 = සම්පටිච්ඡන සිත්
- සන්තීරණ සිත් තුනෙන් 'කුසල විපාක උපේක්ෂා සහගත සන්තීරණය' සහ 'අකුසල විපාක උපේක්ෂා සහගත සන්තීරණය' යන සිත් 2 = **ප්‍රතිසන්ධි සිත්**
- කාමාවචර කුසල විපාක සිත් 8 = **ප්‍රතිසන්ධි සිත්**
- රූපාවචර කුසල විපාක 5 = **ප්‍රතිසන්ධි සිත්**
- අරූපාවචර කුසල විපාක සිත් 4 = **ප්‍රතිසන්ධි සිත්**

මේ අනුව ප්‍රතිසන්ධිය ගෙන දෙන සිත් 19 ක් තිබෙනවා. (කුසල විපාක උපේක්ෂා සහගත සහ අකුසල විපාක උපේක්ෂා සහගත සන්තීරණය සිත් 2 + කාමාවචර කුසල විපාක සිත් 8 + රූපාවචර කුසල විපාක සිත් 5 + අරූපාවචර 4 = 19)

මේ සිත් 19 ප්‍රතිසන්ධියත් හදලා දෙනවා ප්‍රවෘත්ති විපාකත් හදලා දෙනවා. අනිත් සිත් වලින් ලබා දෙන්නේ ප්‍රවෘත්ති විපාක පමණයි.

මේ විදියට තමයි **සංඛාර පච්චයා විඤ්ඤාණං** වෙන්නේ. **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියනකොට ප්‍රතිසන්ධියත් ගන්නවා ප්‍රවෘතියත් ගන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් චක්ඛු විඤ්ඤාණය ප්‍රවෘති විපාකයක් කියලා කිව්වා. නමුත් ඒක නිසා ආපහු පහළ වෙන්න පුළුවන් නේද කාමාවචර කුසල් - විපාක - රූපාවචර ............

<u>පිළිතුර</u> - ඒක මහත්තයා මෙහෙමයි. ඒක ඊට පස්සේ වෙන එකක්. ඒක වෙනම set එකකට යනවා. නමුත් මේවා පහළ වෙන්නේ ඉස්සෙල්ලා කරපු එකක විපාකයක් හැටියට.

දැන් අපිට එක එක ඒවා දකින්න ලැබෙනවා. හොඳ දේවල් සහ නරක දේවල්. ඒ චක්ඛු විඤ්ඤාණ. ඒ චක්ඛු විඤ්ඤාණ පහළ වෙන්න අර packet ඒකෙ තිබෙන එකක් ඒ වෙලාවේදී release වෙලා යනවා. දැන් හොඳ පෙරහැරක් යනවා. ඒ පෙරහැර යන පාරේ අයිනක ගෙදරක ඉන්නවා මනුස්සයෙක්. ඒ මනුස්සයා ඉස්සර කාලේ එහෙම හොඳ සංඛාර උත්පාදනය කරලා නැත්නම් මනුස්සයා නිදි, පෙරහැර යනවා. චක්ඛු විඤ්ඤාණ පහළ වෙන්නේ නෑ. සෝත විඤ්ඤාණ පහළ වෙන්නෙත් නෑ. හැබැයි යම්කිසි පෙරහැරක්

දකින්න ලැබෙන්නේ ගහක් කොළක් දකින්න ලැබෙන්නේ හොඳ දෙයක් ප්‍රසන්න දෙයක් දකින්න ලැබෙන්නේ චක්ඛු විඤ්ඤාණයක් පහළ වෙන්නේ, ඒ වගේම නරක දෙයක් දකින්න ලැබෙන්නෙත් ඇතුලත කර්ම රැස් කරලා තිබෙන නිසා.

මේ සිත් ඔක්කොම සංඛාර වෙන්නෙත් නෑ. ඔක්කොම විඤ්ඤාණ වෙන්නෙත් නෑ. සිත් වල සංඛාර කොටසට අයිති වෙන්නාවූ සිත් ටිකකුත් තිබෙනවා. විඤ්ඤාණ කොටසට අයිති වෙන සිත් ටිකකුත් තිබෙනවා.

| | |
|---|---|
| සංඛාර සිත් | 29 |
| විපාක සිත් | 32 |
| ලෝකෝත්තර සිත් | 08 |
| කාමාවචර ක්‍රියා සිත් | 08 |
| රූපාවචර ක්‍රියා සිත් | 05 |
| අරූපාවචර ක්‍රියා සිත් | 04 |
| පංචද්වරාවජ්ජන ක්‍රියා සිත | 01 |
| මනෝද්වාරාවජ්ජන ක්‍රියා සිත | 01 |
| හසිතුප්පාද ක්‍රියා සිත | 01 |
| | 89 + |

මේ සිත් ටික ඔක්කොම මතක තියා ගන්න. එතකොට කොහේවත් අනාථ වෙන්නේ නෑ. හොඳයි, අද අපි මේ ප්‍රමාණයෙන් අවසන් කරමු. සැම දෙනාටම නිරවුල් ධර්ම අවබෝධයක් වේවා! පටිච්චසමුප්පාදය හොඳට අහලා තේරුම් ගන්න සැමදෙනාටම ශක්තිය ලැබේවා! ඒවගේම ඉස්සරහදිත් මේවා කියනකොට ආපස්සට එන්න තැන් තිබෙනවා. මේ පටිච්චසමුප්පාදය එහෙමයි. මේක නව කථාවක් වගේ කියාගෙන යන්න බෑ ආපහු එන්න වෙනවා. අවිද්‍යාවට යන්න වෙනවා. සංස්කාර වලට ආපහු යන්න වෙනවා. ඊට පස්සේ තමයි විඤ්ඤාණය ඇදලා ගන්න පුළුවන් කම තියෙන්නේ. ඒක නිසා හැමකෙනාටම ඉස්සරහදි පැහැදිලිව පිරිසිදුව මේ කාරණය තේරුම් ගන්න ලැබේවා! ඒවාගේම පටිච්චසමුප්පාදය තේරුම් අරගෙන මේ පටිච්චසමුප්පාද රාමුවෙන් අයින් වෙලා නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.